17

# මිනිසාගේ විස්කම් නිපැයුමක්

පරිසරවේදී සංගමයේ මාසික සභා වාරය සඳහා සිද්ධාර්ථ කනිෂ්ඨ විද්‍යාලයෙහි 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යයෝ ද ශිෂ්‍යාවෝ ද ශාලාවේ රැස්වූහ.

සංගමයේ සභාපති බුද්ධික දේවප්‍රිය ශිෂ්‍යයාගේ ප්‍රධානත්ව-යෙන් වැඩ කටයුතු ආරම්භ විය. සංගමයේ අනුශාසක ධුරය දරන භාග්‍යා ගුරුතුමිය ද, ලෝකනාථා ගුරුතුමිය ද පසෙක හිඳ ගත්හ.



**බුද්ධික** : අද අප ක්‍රියාත්මක කරන්නේ විශේෂ ප්‍රශ්නෝත්තර වැඩසටහනක්. මෙම වැඩසටහනෙහි ප්‍රශ්න ඇසීමට සහ උත්තර සැපයීමට කැමැත්ත ප්‍රකාශ කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කරුණාකර මෙහි පැමිණ අසුන් ගන්න.

මගේ දෙපසින් ඇති බන්දේසි දෙකේ ප්‍රශ්න සහ උත්තර තිබෙනවා.

වම්පසින් සිටින කණ්ඩායම ප්‍රශ්න ඇතුළත් කඩදසි කැබලි ගන්න. දකුණු පසින් සිටින අය උත්තර ඇතුළත් කඩදසි කැබලි ගන්න.

අද අප මෙම වැඩසටහනින් සාකච්ඡා කරන්නේ උදේ සිට රෑ වන තුරු විවිධ විලාසයෙන් අපට දකින්නට ලැබෙන දෙයක් ගැනයි. එනම් **වීදුරු** ගැනයි.

දැන් මෙන්න ප්‍රශ්න විචාරක වැඩසටහන මෙහෙයවීමට, සුරේඛා අභයරත්න.

**සුරේඛා** : භාරදූර කටයුත්තක් පැවරීම ගැන සභාපතිතුමාට ස්තුතියි.

මා ප්‍රශ්න අංකය කියන විට එම ප්‍රශ්න අංකය අතේ ඇති ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව ප්‍රශ්නය හඬ නඟා කියවිය යුතුයි. ඉන්පසු එම ප්‍රශ්නයට උත්තරය අතේ ඇති ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව උත්තරය කියවිය යුතුයි.

ප්‍රශ්න අංක 1 දැන් ඉදිරිපත් කරන්න.



**මාසවන්** : මා ළඟයි ප්‍රශ්න අංක 1. බැලූ බැල්මට අපට පෙනෙන්නේ වීදුරු ඝන ද්‍රව්‍යයක් ලෙසයි. මෙහි සැබෑ තත්ත්වය **කුමක් ද?**

**සුරේඛා** : කෝ? කා ළඟ ද ප්‍රශ්න අංක එකේ පිළිතුර?

**තවිලි** : ඔව්. මෙන්න උත්තරය. ඝන ද්‍රව්‍යයක් වගේ පෙනුණාට ඇත්ත වශයෙන් වීදුරු, උණු කර ඉන් පසු අධි ශීතලයට ලක් කළ දියරක්.

**සුරේඛා** : ප්‍රශ්න අංක 2

**ප්‍රබෝධ** : වීදුරු සාදන්නේ කුමන ද්‍රව්‍යවලින් ද?



**සංඝමිත්තා** : වීදුරු සෑදීමට අද බහුලව යොද ගන්නේ වැලියි. වැලි, සෝඩා අළු හුනු යන මේ ද්‍රව්‍ය මිශ්‍ර කර උණු කරනවා. සෙන්ටිග්‍රේඩ් $800^0$ දී පමණ එම මිශ්‍රණය දියරක් බවට පත් වෙනවා. එවිට වහා ම අධි ශීතලයට ලක් කෙරෙනවා. වීදුරු සාද ගන්නේ ඒ ආකාරයටයි.

**සුරේඛා** : ප්‍රශ්න අංක 3

**අභයදේව** : වීදුරුවල දක්නට ලැබෙන ගති ලක්ෂණ මොනවා ද?

**ධනලක්ෂ්මී** : වීදුරු විනිවිද පෙනෙන ද්‍රව්‍යයක්. මේ නිසා නොයෙක් දේ අසුරා තැබීම සඳහා වීදුරු බඳුන් ගන්නවා. වීදුරු ජලයට ඔරොත්තු දෙයි. ඒ වගේම විවිධ කාලගුණ **තත්ත්වයන්** යටතේ වෙනස් නොවෙයි. වීදුරු රසායනික ද්‍රව්‍යවලට ප්‍රතික්‍රියා නොකරයි. වීදුරු තුළින් විදුලිය කාන්දු වන්නේ නැහැ. මේ නිසා විදුලි ආවරණ,

**විදුලි බුබුළු සෑදීමට වීදුරු පාවිච්චි කරනවා. ප්‍රධාන ම ලක්ෂණයක් නම් වීදුරු සෑදීමේ දී ඕනෑම හැඩයක් දිය හැකි වීමයි.**



**සුරේඛා** : ප්‍රශ්න අංක 4

**අභිරූපිකා** : මල්පෝච්චි, වීදුරු බෝතල්, ආදිය සෑදීමට ගන්නා මූල ද්‍රව්‍ය මොනවා ද?

**රාජේන්ද්‍ර** : වැලිවලට සෝඩා අළු සහ අළු හුණු එකතු කළ විට හඳුන්වන්නේ "**සෝඩා ලයිම් වීදුරු**" යන නමින්. බෝතල්, විදුලි බුබුළු වැනි ගෘහස්ථ භාණ්ඩ කීපයක් ම මේ සෝඩා ලයිම් වීදුරුවලින් නිපදවනවා.

**සුරේඛා** : ප්‍රශ්න අංක 5

**මෛත්‍රී** : **පළිඟු වීදුරු** හෙවත් **ක්‍රිස්ටල් වීදුරු** යන නමින් හඳුන්වන ඉතා දකුම්කලු වීදුරු වර්ග වෙළෙඳපොළේ තිබෙනවා නේ ද?

**සබිනා** : ක්‍රිස්ටල් වීදුරු සෑදීමට ගන්නේ ඊයම්, ලවණ සහ වැලි මිශ්‍රණයක්. මේ පළිඟු වීදුරු තුළ ආලෝකය පිටතට යා නොදී ඇතුළට හැරී හැරී ගමන් කරනවා. මේ නිසා දිලිසීම වැඩියි. සාමාන්‍යයෙන් ඇස් කණ්ණාඩිවල කාචය සෑදීමට ද ගන්නේ මේ ඊයම් ලවණ මිශ්‍රිත වීදුරුයි.



**සුරේඛා** : ප්‍රශ්න අංක 6

**සාලිමා** : සාමාන්‍යයෙන් වීදුරු බිඳෙන සුලුයි. මෙය අවාසිදායක ලක්ෂණයක් නේ ද?

**ප්‍රභාත්** : ඔව්. සාමාන්‍ය වීදුරු යමක ගැටුණොත් බිඳෙනවා. ඒ වගේ ම වීදුරුවලට අධික උෂ්ණය හෝ අධික සීතල දරාගන්න බැහැ. මීට හේතු වන්නේ වීදුරු තුළින් උෂ්ණත්වය ඉතා සෙමින් ගලා යාමයි.

**සුරේඛා** : ප්‍රශ්න අංක 7



**පාතිමා** : දන් වෙඩි නොවදින වීදුරු තිබෙනවා නේ ද?

**පාඨලී** : ඔව්. අද ඇතැම් වාහනවල යොදා තිබෙන්නේ වෙඩි නොවදින වීදුරුයි.

මෙම වෙඩි නොවදින වීදුරු තනා ඇත්තේ වීදුරු තහඩු දෙකක් අතරට තද ප්ලාස්ටික් මැලියම් තට්ටුවක් යෙදීමෙන්. මෙබඳු වීදුරුවකට වෙඩි වැදුණු විට වීදුරුව කුඩා කැබලිවලට බිඳී ගියත් වෙඩි උණ්ඩය ප්ලාස්ටික් තලයේ රැඳෙනවා.

***(ආචාර්ය උපාලි ඇම් සේනානායක ගේ "වීදුරු ගැන තතු සෙවීමක්"*** *නමැති ලිපිය ඇසුරින් සැකසිණි.)*

**සභාපති** : සුරේඛා අභයරත්න සොහොයුරියට ස්තුතියි.

**බුද්ධික** : අද අපේ ප්‍රශ්නෝත්තර වැඩ සටහනින් සාකච්ඡා කළේ වීදුරු ගැනයි.


එහෙ බැලුවත් වීදුරු
මෙහෙ බැලුවත් වීදුරු
සෑම තැන ම වීදුරු
පාට පාට වීදුරු

වීදුරු මිනිසාගේ විස්කම් නිපැයුමක්.

දැන් අපි ආරාධනා කරනවා භාග්‍යා ගුරුතුමියට. ඒතුමිය වචන ස්වල්පයක් කථා කරනවා ඇති.

**භාග්‍යා** : මෙතෙක් වේලා

**ගුරුතුමිය** ඔබට දැන ගැනීමට ලැබුණේ වීදුරු සාදන හැටි, වීදුරුවල ලක්ෂණ ආදියයි. *(වීදුරුවක් පෙන්වමින්)* මා දැන් ඔබට විවෘත ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. මේ තිබෙන්නේ සාමාන්‍ය වීදුරුවක්. මෙහි පානීය ජලය තිබෙනවා.



දැන් හිතන්න. වෙනත් දේ කිරීමට හෝ තැබීමටත් මෙම වීදුරුව පාවිච්චි කළ හැකියි. කරුණාකර අත ඔසවා ඉන් පසු නැගිට උත්තර දෙන්න.

**උදුලා** : බුද්ධ පූජාව සඳහා පැන් තැබීමට......

**ගුරුතුමිය** : ඔව්. හොඳයි. තව කියන්න.



**භානුක** : පෑන්, පැන්සල්, මකන ආදිය දැමීමට.......

**ධනුෂ්ක** : වීදුරු කීපයකට ජලය පුරවා එකිනෙකට තට්ටු කරමින් ශබ්දයක් නිකුත් කිරීමට.......

**ගුරුතුමී** : ඔව්. එම සංගීත භාණ්ඩය හඳුන්වන්නේ "**ජල තරංග**" නමින්.

**හම්ඩි** : කඩදාසි කොළ සුළඟේ යන විට බරක් ලෙස තැබීමට.......

**ගුරුතුමී** : හොඳයි. වීදුරුව පාවිච්චි කළ හැකි අවස්ථා කීපයක් ගැන ඔබ සඳහන් කළා. ගෙදර ගිය විට සිතන්න. තවත් අවස්ථා මතක් වේවි.

**සභාපති** : ස්තුතියි, ගුරුතුමියට. අද අපි වැඩසටහන මෙතකින් අවසන් කරනවා. දැන් අපේ සංගමයේ ලේකම් මධුභාෂිණී සොහොයුරිය ස්තුති කථාව පවත්වනවා ඇති.

## පැහැදිලි කිරීම්

**විස්කම්** – විශ්ව කර්ම දිව්‍යපුත්‍රයා (ඕනෑ ම දෙයක් නිර්මාණය කිරීමේ දක්ෂ දෙවි කෙනෙකි.)

## අවබෝධය සහ රස විඳීම

1. වීදුරු සෑදීමට ගන්නා මූල ද්‍රව්‍ය නම් කරන්න.
2. පාඩමේ සඳහන් වන කරුණු අනුව වීදුරුවල දක්නට ලැබෙන ගති ලක්ෂණ මොනවා ද?
3. මේවා කෙටියෙන් හඳුන්වන්න.
   i. වෙඩි නොවදින වීදුරු
   ii. ක්‍රිස්ටල් වීදුරු
4. ඇස් කණ්ණාඩිවල කාචය සෑදීම සඳහා ගන්නා වීදුරු වර්ගය කුමක් ද?

## භාෂා ක්‍රියාකාරකම්

1. පහත දැක්වෙන අකුරු යෙදෙන වචන පාඩමෙන් සොයා ලියන්න. **ඛ, ඝ, ඪ, ධ, ඬ**

2. (අ) අතීත කාල ආඛ්‍යාත පද යොදන්න.

   i. සමාන්තර පන්තිවල ශිෂ්‍යයෝ ද ශිෂ්‍යාවෝ ද ශාලාවේ ..............

   ii. භාග්‍යා ගුරුතුමිය ද ලෝකනාථා ගුරුතුමිය ද පසෙක ............

   iii. භානුක ද ධනුෂ්ක ද වීදුරුවකින් ගත හැකි ප්‍රයෝජන ගැන ...........

   (ආ) වර්තමාන කාල ආඛ්‍යාත පද යොදන්න.

   iv. පරිසරවේදී සංගමයේ රැස්වීමට පැමිණි සියලු සිසුහු වීදුරු ගැන කරුණු ............

   v. අභිරූපිකා ද ධනුෂ්ක ද ජල තරංග වාදනය ................

   vi. ගුරුවරු ද විදුහල්පතිතුමා ද වීදුරු ගැන වැඩ සටහනට ප්‍රශංසා .............

## පැවරුම්

1. මෙදින පැවැත්වූ සභා වාරයේ න්‍යාය පත්‍රය සකස් කරන්න.
2. පුවත් පත්, සඟරා ආදියෙහි දක්නට ලැබෙන, වීදුරු පිළිබඳ වෙළෙඳ දැන්වීම් එකතු කරන්න.
3. මෙහි සඳහන් කරුණු සහ වෙනත් කරුණු ඇසුරු කර ගෙන **වීදුරු** ගැන ඡේද දෙකක් ලියන්න.